රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 12/2003(V)

මගේ අංකය : EST-7/04/CAB/4000(iv)
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2026.08.05

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>භාෂා පරිවර්තනය, භාෂණ පරිවර්තනය හා යතුරුලියනය කිරීම වෙනුවෙන් වූ ගාස්තු සංශෝධනය කිරීම</u>**

ඉහත කරුණ සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2016.08.22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2003(III) සහ 2017.02.27 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2003(IV) හි සඳහන් ගාස්තු වෙත ඔබගේ අවධානය යොමු කරවමි.

02. එම චක්‍රලේඛයන්හි සඳහන් ගාස්තු පහත පරිදි සංශෝධනය කිරීමට 2026.06.30 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර ඇත.

03. **පරිවර්තන ගාස්තු**

**(අ) <u>භාෂා පරිවර්තන ගාස්තු</u>**

I. ලේඛන වර්ගය නොසලකා, පරිවර්තනය කරනු ලබන වචන ගණන අනුව එක් වචනයකට රු.5.00ක් බැගින් ගෙවිය යුතුය.

II. පරිවර්තනය කිරීම සඳහා උපයෝගී කරගනු ලබන ලියවිල්ලෙහි සඳහන් වචන සංඛ්‍යාව හෝ පරිවර්තිත පිටපතෙහි සඳහන් වචන සංඛ්‍යාව හෝ පදනම් කරගනිමින් අදාළ ගාස්තු ගෙවිය හැකිය.

III. 1996.07.19 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 20/96 කෙරෙහි ඔබේ අවධානය යොමු කරවන අතර, ඒ අනුව භාෂා පරිවර්තකයින් නොමැති ආයතන සඳහා, භාෂා පරිවර්තනය පිළිබඳ වෘත්තීමය සුදුසුකම් සහිත පුද්ගලයන් තෝරාගෙන සම්පත්දායක ලේඛනයක් පවත්වා ගනිමින් සේවා අවශ්‍යතාව මත එම පරිවර්තනයන් සිදු කළ හැකිය.

(ආ) <u>භාෂණ පරිවර්තන ගාස්තු</u>

| භාෂණ පරිවර්තනයේ ස්වභාවය | පැයකට (රු.) |
|---|---|
| (අ) පළාත් සභා හා පළාත් පාලන ආයතනයන්හි සභා රැස්වීම්වල කථා සමගාමී/ක්ෂණික පරිවර්තන | 1400/- |
| (ආ) විද්‍යාත්මක හෝ තාක්ෂණික ස්වභාවයේ ශාස්ත්‍රීය දේශන සමගාමී/ක්ෂණික පරිවර්තන | 1500/- |
| (ඇ) මහජන රැස්වීම්, සාකච්ඡා හා ඉහත "(ආ)"හි සඳහන් නොවන වෙනත් දේශන සමගාමී/ක්ෂණික පරිවර්තන | 1000/- |

04. <u>**යතුරුලියන ගාස්තු**</u>

(අ) යතුරු ලියනය කෙරෙන පිටුවක් සඳහා

I. වචන 360ක් හෝ ඊට වැඩි රු.90/-

II. වචන 240 – 359 දක්වා රු.80/-

III. වචන 240ට අඩු රු.60/-

(ආ) ඉටිපත් කැපීම සඳහා පිටුවකට රු.100/-

ඉහත සඳහන් යතුරුලියනය කිරීමේ ගාස්තු, පරිගණකයෙන් මුද්‍රණය කිරීම වෙනුවෙන් ද ගෙවිය හැකි අතර අදාළ ගාස්තු ප්‍රමාණයන් ගෙවිය යුතු වන්නේ කැලි පදනම මත වැඩ කොටස් ඉටු කරවා ගැනීමේදී පමණි.

05. ඉහත සඳහන් සංශෝධිත ගාස්තු 2026.08.01 දින සිට බලපැවැත්වේ.

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන
අමාත්‍යාංශය

දුරකථන : 011-2697233
ෆැක්ස් : 011-2692158
විද්‍යුත් තැපැල : ad-7-est@pubad.gov.lk